# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2024.12.25 පැය 0610 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1882 /2024 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**01. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදුකර, කාන්තාවකට බරපතල තුවාල සිදුකිරීමක් - වැල්ලව පොලිස් වසම.**

2024.12.24 වන දින රාත්‍රී කාලයේ වැල්ලව පොලිස් වසමේ මරළුවාව ප්‍රදේශයේ නිවසක සිටි අඹු සැමි යුවළකට නාඳුනන පුද්ගලයෙකු විසින් වෙඩි තබා පලාගොස් ඇති බවට වැල්ලව පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත. වෙඩි වැදීමෙන් තුවාල ලැබූ අඹු සැමි යුවල කුරුණෑගල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පිරිමි පුද්ගලයා මියගොස් ඇති අතර, කාන්තාව රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබයි.

**මරණකරු වයස අවුරුදු 32 ක් හා තුවාලකාරිය වයස අවුරුදු 30 ක් වන මරළුවාව ප්‍රදේශයේ තාවකාලිකව පදිංචිව සිටි අඹුසැමි යුවලකි.**

වෙඩි තැබීමට හේතුව හෝ සැකකරුවන් සම්බන්ධ තොරතුරු මෙතෙක් අනාවරණය වී නොමැත. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා වැල්ලව පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයට තැත් කිරීමේ අපරාධයකට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.12.14 වන දින කාලයේ මරදාන පොලිස් වසමේ මාලිගාකන්ද අධිකරණය අසලදී වෙඩි තබා කාන්තාවක් ඝාතනය කිරීමට තැත් කිරීමේ අපරාධය සම්බන්ධයෙන් මරදාන පොලිස් ස්ථානය හා කොළඹ අපරාධ කොට්ඨාසය මගින් විමර්ශන ආරම්භ කර තිබුණි.

එම විමර්ශනයේදී අනාවරණය වූ කරුණු මත අපරාධය සිදුකල වෙඩික්කරු ගිනි අවියද සමඟ සැඟව සිටි නිවසේ අයිතිකරු හා ඔහුගේ බිරිඳ විසින් ගිනි අවිය බැහැර කර ඇති බවට හෙළිවීමෙන් පසු 2024.12.20 වන දින ඔවුන් දෙදෙනෙකු කොළඹ අපරාධ කොට්ඨාසය අත්අඩංගුවට ගෙන ඇත.

ඔවුන්ගෙන් සිදුකරන ලද ප්‍රශ්න කිරීමේදී, එම ගිනි අවිය ත්‍රීරෝද රථ රියදුරෙකුට ලබාදී ඇති බවත්, ඒ අනුව එම ත්‍රීරෝද රථ රියදුරු 2024.12.22 වන දින අත්අඩංගුවට ගෙන ඇත.

ඔහුගෙන් සිදුකරන ලද ප්‍රශ්න කිරීම් වලදී මෙම ගිනි අවිය ජම්පටාවීදිය වෙත රැගෙන ගොස් වෙනත් පුද්ගලයෙකුට ලබා දී ඇති අතර ඒ අනුව අනාවරණය කරගත් කරුණු මත එම සැකකරු **2024.12.24 වන දින සවස් කාලයේදී වෙරළබඩ පොලිස් වසමේ ජම්පටාවීදිය ප්‍රදේශයේදී** මනුෂ්‍ය ඝාතනයකට තැත්කිරීමට ආධාර අනුබල දීමේ චෝදනාව මත අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන ජම්පටාවීදිය, කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය හා මරදාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. මනුෂ්‍ය ඝාතනයකට අවශ්‍ය කර සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මාදම්පේ පොලිස් වසම.**

2024.12.22 වන දින මාදම්පේ පොලිස් වසමේ දෙමටපිටිය ප්‍රදේශයේදී පුද්ගලයින් දෙදෙනෙකු අතර ඇති වූ බහින් බස් වීමක් දුර දිග යාමෙන් පසු අතින් පයින් පහරදී වයස අවුරුදු 42 ක් වූ මනක්කුලම, කාක්කපල්ලිය ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකු ඝාතනය කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් මාදම්පේ පොලිස් ස්ථානය මඟින් විමර්ශන ආරම්භ කර තිබුණි.

සිදුකරන ලද විමර්ශනයේදී අපරාධයට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු **2024.12.24 වන දින සවස් කාලයේ මාදම්පේ පොලිස් වසමේ දෙමටපිටිය ප්‍රදේශයේදී** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 28 හා 53 වයස්වල පසුවන කරවිටාගාරය ප්‍රදේශයේ පදිංචි පියෙකු සහ පුතෙකු වේ.**

මාදම්පේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. මනුෂ්‍ය ඝාතනයකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - දික්වැල්ල පොලිස් වසම.**

2024.12.20 වන දින දික්වැල්ල පොලිස් වසමේ වත්තේගම ප්‍රදේශයේදී හඳුනා නොගත් එන්නතක් විද අවුරුදු 69 ක් වූ වත්තේගම දකුණ, දික්වැල්ල ප්‍රදේශයේ පදිංචි කාන්තාවක් ඝාතනය කිරීම සම්බන්ධයෙන් දික්වැල්ල පොලිස් ස්ථානය මඟින් විමර්ශනක් ආරම්භ කර තිබුණි.

සිදුකරන ලද විමර්ශනයේදී මෙම අපරාධයට සම්බන්ධ සැකකරුවෙකු **2024.12.24 වන දින සවස් කාලයේ දී දික්වැල්ල පොලිස් වසමේ දඹගස්ආර ප්‍රදේශයේදී** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන දඹගස්ආර, දික්වැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඉඩමක ආරවුලක් හේතුවෙන් මෙම අපරාධය සිදුකර ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. දික්වැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. දිය අනතුරකින් විදේශීය ජාතිකයෙකු බේරා ගැනීම - අහුන්ගල්ල පොලිස් ජීවිතාරක්ෂක ඒකකය.

2024.12.24 වන දින උදෑසන කාලයේ අහුන්ගල්ල පොලිස් වසමේ අහුන්ගල්ල මුහුදු තීරයේ දිය නාමින් සිටි විදෙස් ජාතිකයෙකු දිය වැලකට හසුව ගසාගෙන යමින් සිටියදී වෙරළ තීරයේ රාජකාරී යෙදී සිටි පොලිස් ජීවිතාරක්ෂක නිලධාරීන් විසින් බේරා ගෙන ප්‍රථමාධාර ලබා දී ඇත.

**දිය අනතුරින් මුදාගත් පුද්ගලයා වයස අවුරුදු 64 ක පසුවන පෝලන්ත ජාතිකයෙකි.**

අහුන්ගල්ල පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කරනු ලබන පොලිස් ජීවිතාරක්ෂක ඒකකයේ පොලිස් පරික්ෂක මනෝජ් ආරියරත්න, පොලිස් කොස්තාපල් 29896 ලසන්ත, පොලිස් කොස්තාපල් 13342 සංගීත් හා පොලිස් කොස්තාපල් 103992 දුලංජය යන නිලධාරීන් විසින් මෙම දිවි බේරා ගැනීම සිදුකර ඇත.

## 06. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - නුගේගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.12.24 වන දින උදෑසන කාලයේදී මීගොඩ පොලිස් වසමේ වටරැක ප්‍රදේශයේදී නුගේගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 100 ක් හා හෙරොයින් ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 900 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු මත්ද්‍රව්‍ය අලෙවියෙන් උපයාගන්නා ලද බවට සැක කරන මුදල් රුපියල් 10,000/= ක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන පාදුක්ක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු මාලඹේ පොලිස් වසමේ සිදු වූ අපරාධයකට වරෙන්තු නිකුත් වී ඇති සැකකරුවෙකු වන අතර විදේශීය රටක සිට මෙරට මත්ද්‍රව්‍ය ජාවාරම් මෙහෙයවනු ලබන සංවිධානාත්මක අපරාධකරුවෙකුගේ මත්ද්‍රව්‍ය ජාලය මෙහෙයවන සැකකරුවෙකුද වේ. මොහුගෙන් සිදුකරන ලද වැඩිදුර ප්‍රශ්න කිරීමේදී මෙම මත්ද්‍රව්‍ය ජාලයට සම්බන්ධ තවත් සැකකරුවෙකු 2024.12.24 වන දින දහවල් කාලයේ මීගොඩ පොලිස් වසමේ වටරැක දුම්රියපොල අසලදී **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 300 ක්** සන්තකයේ තබාගෙන සිටියදී අත්අඩංගුවට ගෙන මීගොඩ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන මීගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි**

නුගේගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය හා මීගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07.** **කුෂ් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන්තොටුපල ඒකකය.**

2024.12.24 වන දින දහවල් කාලයේ ගුවන් තොටුපල රේගු මත්ද්‍රව්‍ය පාලන ඒකකයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **කුෂ් මත්ද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 04 ග්‍රෑම් 388 ක්** මෙරටට ආනයනය කිරීම, ජාවාරම් කිරීම හා සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන බියගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන්තොටුපල ඒකකය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08.** **හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.12.24 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ සේන මාර්ගයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 500 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන බොරුපන, රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09.** **හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - බොරැල්ල පොලිස් ස්ථානය.**

2024.12.24 වන දින උදැසන කාලයේ බොරැල්ල පොලිස් වසමේ සර්පන්ටයින් මාර්ගයේදී බොරැල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 07 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 51 ක් වන බොරැල්ල, කොළඹ 08 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඔහුගෙන් සිදුකරන ලද ප්‍රශ්න කිරීමේදී, ලබාදුන් තොරතුරු අනුව හෙරොයින් මත්ද්‍රව්‍ය ජාවාරම සිදුකරන සැකකරුවෙකු මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගන්නා ලදැයි සැක කරන මුදල් රුපියල් 1,917,900/- ක් සමග හෙරොයින් ළග තබාගැනීම හා ජාවාරම් කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වන බොරැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බොරැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. **බඳින තුවක්කුවක් පත්තු වී පුද්ගලයෙකු මියයාම - නාඋල පොලිස් වසම.**

2024.12.24 වන දින උදෑසන කාලයේ නාඋල පොලිස් වසමේ මොරගහකන්ද ජලාශයේ ඉහළ රක්ෂිතයේදී ධීවර කටයුතු සඳහා පිටව ගිය පුද්ගලයෙකුට බඳින කඳක් පත්තුවීමෙන් තුවාල ලබා කෝන්ගහවෙල රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා දඹුල්ල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට නාඋල පොලිසියට ලද පැමිණිල්ලක් විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 39 ක් වන රජාවෙල, කෝන්ගහවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය දඹුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. නාඋල පොලිසිය වැඩිදුර විමර්ශනය කරනු ලබයි.

## 11. **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගිරිබාව පොලිස් ස්ථානය.**

2024.12.24 වන දින සවස් කාලයේ ගිරිබාව පොලිස් වසමේ වල්පාළුව ප්‍රදේශයේදී ගිරිබාව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 61 ක් වන තඹුත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගිරිබාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. **බලපත්‍ර නොමැතිව මැණික් ගැරූ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - නෝර්වුඩ් පොලිස් ස්ථානය.**

2024.12.24 වන දින දහවල් කාලයේ නෝර්වුඩ් පොලිස් වසමේ කෙහෙල්ගමුව ගඟ ආශ්‍රිත ප්‍රදේශයේදී නෝර්වුඩ් පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 21, 50 හා 58 වයස්වල පසුවන ගම්පොළ, බගවන්තලාව හා පරකඩුව යන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

නෝර්වුඩ් පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 13. **ව්‍යාජ මුදල් නෝට්ටුවක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඇඹිලිපිටිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.12.24 වන දින දහවල් කාලයේ ඇඹිලිපිටිය පොලිස් වසමේ මහපැලැස්ස ප්‍රදේශයේදී ඇඹිලිපිටිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **රුපියල් 5,000/- ව්‍යාජ මුදල් නෝට්ටුවක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇඹිලිපිටිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන කුඹුගොඩආර, ඇඹිලිපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඇඹිලිපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**